ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2025 අගෝස්තු 08 නිකිණි කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

“ හරි මග පෙන්වීම ”

“තව්විසි ධනඤ්ජානි අප්පමත්තෝත්ථි? කුතෝ හෝ සාරිපුත්ත අම්හාකං අප්පමාදෝ, යේසං නෝ මාතාපිතරෝ පෝසේතබ්බා පුත්ත දාරා පෝසේතබ්බා .....අයම්පි කායෝ පීණේතබ්බෝ බ්‍රූහේතබ්බෝ

(මජ්ඣිම නිකාය, ධනඤ්ජානි සුත්‍රය)

සුපින්වතුනි,

සැරියුත් මහරහතන් වහන්සේ දක්ඛිණා ගිරියෙහි චාරිකා කරද්දී, රජගහ නුවර සිට පැමිණි භික්ෂුවක් මුණ ගැසුණා. සැරියුත් හාමුදුරුවෝ ඒ භික්ෂුවගෙන් බුදුරජාණන් වහන්සේගේත්, මහා සංඝයාගේත් සුවදුක් අහලා ඒ සියලු දෙනා හොඳින් ඉන්නවා කියලා දැනගෙන “ආයුෂ්මතුනි, රජගහ නුවර කිට්ටුව තියෙන ‘තණ්ඩුලපාල ද්වාර’

ප්‍රදේශයේ ජීවත් වන ධනඤ්ජානි බමුණා ලෙඩක් දුකක් නැතුව ඉන්නවාද? කියා ඇසුවා. එහෙමයි ආයුෂ්මතුනි, ඔහු නිරෝගීව ඉන්නවා. “ඔහු අප්‍රමාදීව කුසල් දහම් රැස් කරමින් ධාර්මිකව ජීවත් වෙනවාද?”

ආයුෂ්මතුනි, ඔහුගේ දැහැමි බවක් නම් නැහැ. ඔහු රජතුමාගේ හිත දිනාගෙන, රාජ්‍ය බලය පෙන්වමින් අනෙක් අයගේ ධනය පැහැර ගන්නවා. තවත් අය සමග එකතු වෙලා රජයට ලැබෙන්න තියෙන ආදායම් බදු වංචා කරනවා. එයා කලින් කසාද බැඳලා හිටියෙ. බොහොම හොඳ ශ්‍රද්ධාවන්ත කාන්තාවක්. එයා ඉන්න කාලෙ ඔය වගේ අධාර්මික වැඩ කරන්න ඉඩ දුන්නේ නැහැ. එයා හදිසියේ මිය ගිහින්. ඊට පස්සේ විවාහ කර ගත් කාන්තාවට කිසිම ශ්‍රද්ධාවක් නැහැ. එයාට ඕන සල්ලි. අධාර්මික වැඩ වලින් ධනය උපයන්න එයා ධනඤ්ජානි බමුණාට උදව් කරනවා. දැන් බමුණත් ටිකෙන් ටික අධාර්මික පැත්තටම බරවෙලා".

"ආයුෂ්මතුනි, මගේ හිතවතකු වූ ධනඤ්ජානි බමුණා ගැන ඔබෙන් අහන්න ලැබුණේ නරක ආරංචියක් නේ. මට ළඟදීම ඔහු හමුවෙලා කතාබහ කරන්න ලැබෙනවා නම් හොඳයි".

ඉන්පසු සැරියුත් හාමුදුරුවෝ පිළිවෙලින් චාරිකා කරමින් නැවත රජගහනුවරට වැඩ පසු දින රජගහනුවරට වැඩම කළා. වේළුවනාරාමයෙහි නතර වී පසු දින නගරයෙහි පිණ්ඩපාතය සඳහා වැඩියා.

ඒ වෙලාවේ ධනඤ්ජානි බමුණා නගරයෙන් පිටත පිහිටි ඔහුගේ ගව පට්ටියක කිරිදොවමින් හිටියෙ. සැරියුත් හාමුදුරුවෝ දානය වළඳලා ඔහු වෙත වැඩියා. සැරියුත් හිමියන් දුරදීම දුටු බමුණා ඒ වෙලාවේම දොවා ගත් කිරිටිකක් බඳුනකට දමා උන් වහන්සේට පිළිගැන්නුවා. තමන් දැන් වලඳා සිටි හෙයින් එය ප්‍රතික්ෂේප කල සැරියුත් හාමුදුරුවෝ "මං අර රුක් සෙවනේ දවල් කාලෙ ඉන්නවා. ඔබේ කිරිදෙවීම් කටයුතු අවසන් වුණාම එතැනට එන්නැයි" පවසා වැඩියා.

බමුණා කටයුතු අවසන් කර උදේ ආහාරය ගෙන සැරියුත් හිමි වෙත ගොස් එකත්පස්ව වාඩිවී පිළිසඳරෙ යෙදුණා. "පින්වත් ධනඤ්ජානි, ඔබ නොපමාව කුසල් දහම් වල යෙදෙනවා නේද? සැරියුත් හිමි විමසුහ.

කොයින්ද හාමුදුරුවනේ අපට ඕවට වෙලාවක් හැම තිස්සෙම වැඩ, වැඩ මව්පියන්, අඹුදරුවන්, සේවකයන් පෝෂණය කරන්න ඕන. යාළුවන්ට, අසල්වැසියන්ට, නෑයන්ට, ආගන්තුකව නිවසට එන අයට, යුතුකම් කරන්න ඕන. සලකන්න ඕන. මළගිය අය වෙනුවෙන් කළයුතු යාග හෝම කරන්න ඕන. දෙවියන්ට පුද පූජා තියන්න ඕන, රජතුමා පවරන වැඩ කරන්න ඕන. ඒ වැඩ රාජකාරි අතරෙ මාත් සතුටු වෙන්න ඕන. මේ ශරීරය පිනවන්න ඕන. ඉතින් ඔය වගේ දහසක් වැඩ රාජකාරි අස්සේ ධර්මයෙහි හැසිරෙන්න මට වෙලාවක් නැහැ."

'හොඳයි බමුණ, ඔබ මව්පියන්ට සලකන්න ඕන. අඹු දරුවන්ට සේවකයන්ට, සලකන්න ඕන කියල, අධර්මයෙන් ජීවත් වෙනවා නම් වැරදි, වැඩ කරනවා නම් ඒ අකුසල් නිසා ඔබ මියගිය දවසක යමපල්ලන් ඇවිත් කතා කරන විට "අනේ මාව නිරයට එක්ක ගෙන යන්න එපා. මම අධාර්මික විදියට හරිහම්බ කළේ මගේ දෙමව්පියන්ට, අඹු දරුවන්ට කන්න අඳින්න අරන් දෙන්න ඕන නිසයි. මා ඒ ධනයෙන් ඔවුන්ට සැලකුවා.

ඒ නිසා මාව නිරයට එක්කගෙන යන්න එපා. කියල කිව්වොත් නිරයපාලයෝ ඒක අහලා ඔබව නිරයට ඇදගෙන යන එක නතර කරනවද? ඒ වෙලාවේ දෙමව්පියොත්, අඹු දරුවොත්, අනේ මෙයා වැරදි වැඩ කරලා හරි හම්බ කලේ අපට කන්න අඳින්න දෙන්න, අපව පෝෂණය කරන්න ඒ නිසා මෙයාව නිරයට ඇදගෙන යන්න එපා කියලා කෑගහල කිව්වත් නිරයපාලයෝ ඒක අහල ඔබ නිරයට ඇදගෙන යන එක නතර කරනවද?"

“ නැහැ ශාරිපුත්‍රයෙනි, කවුරු කෑගැහුවත්, විලාප දුන්නත් වැඩක් නැහැ. හඬා වැළපෙද්දීම නිරයට ඇදගෙන යනවා.

“මා සේවකයන් නඩත්තු කරන්න, යාලුවන්ට, නෑදෑයන්ට, ආගන්තුකයන්ට, සලකන්න මළගිය අයට යුතුකම් ඉටුකරන්න දෙවියන්ට පුද පූජා තියන්න, රජතුමාට දෙන්න තමයි මෙහෙම අධාර්මික විදියට හම්බ කළේ. ඒ නිසා මාව නිරයට ඇදගෙන යන්න එපා කියල නිරය පාලයන්ගෙන් බේරෙන්න පුළුවන්ද?

“ශාරිපුත්‍රයෙනි, එහෙම ඉඩක් සමාවක් ලැබෙන්නේ නැහැ. මට නිරයට යන්නම වෙනවා.

“බමුණා, යම් කෙනෙක් දෙමව්පියන්, අඹු දරුවන්, යහළුවන්, නෑයන්, අසල්වැසියන්, අමුත්තන්, උදෙසා හෝ රජතුමා සඳහා හෝ දෙවියන් සඳහා හෝ අධර්මයෙහි හැසිරෙන එකද ධර්මයෙහි හැසිරෙන එකද වඩා උසස් වෙන්නේ ? “ ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, ධර්මයෙහි හැසිරීම තමයි ශ්‍රේෂ්ඨ, ධර්මානුකූලව තමයි ඔය හැම දෙනාටම සලකන්න ඕන.”

“පින්වත් ධනඤ්ජානි, යහපත් රැකියාවක් කරලා ඔය හැම දෙනාටම සලකන්න පුළුවන් නේ? එහෙම ධාර්මික රැකි රක්ෂා තියෙනවා නේද? එතකොට අප්‍රමාදීව පින් දහම් කරන්නත් පුළුවන් නේ? තමන්ට සැපසේ ජීවත් වෙන්නත් පුළුවන් නේ? ඒ නිසා එබඳු දැහැමි රැකියාවක් ගැන හිතන්න.

ධනඤ්ජානි බමුණා සැරියුත් හාමුදුරුවන්ගේ කතාවෙන් සතුටු වුණා. ඒ අවවාද පිළිගෙන එතැනින් නැඟිට පිටත් වෙලා ගියා. ඔහොම කාලයක් ගත වුණා. බමුණා නරක වැඩ ඔක්කොම අතහැරියා. දැහැමින් ජීවත් වුණා. එවිට එක්තරා පුරුෂයකුට කතා කොට ඔබ බුදුහාමුදුරුවන් වෙතට ගිහින් මා වෙනුවෙන් උන්වහන්සේගේ දෙපා වඳින්න. ඊළඟ සැරියුත් හාමුදුරුවන් ලඟටත් ගිහින් මගේ වවනෙන් වැඳ ඒ විදියට කියන්න. සැරියුත් හාමුදුරුවන්ට මෙහාට වඳින ලෙස ආරාධනා කරන්න. ඒ පුරුෂයා පන්සලට ගිහින් සැරියුත් හිමියන්ට ආරාධනා කළා. සැරියුත් හාමුදුරුවෝ නිහඬව ඒ ආරාධනාව භාර ගත්තා. රහතන් වහන්සේලා එහෙමයි.

සැරියුත් හාමුදුරුවෝ පාත්‍රා සිවුරු රැගෙන බමුණාගේ නිවසට වැඩ පැනවූ අසුනෙහි වැඩසිටියා. පින්වත් ධනඤ්ජානි ඔබට ඉවසන්න පුළුවන් තරමට නේද වේදනාව තියෙන්නේ. දුක් වේදනා ටිකින් ටික අඩු වෙනවා නේද?.වැඩිවෙන්නේ නැහැ නේද?.

ශාරිපුත්‍රයින් වහන්ස, මට ඉවසන්න ආමාරුයි. දුක වේදනාව වැඩි වෙනවා මිස අඩු වීමක් පෙනෙන්නේ නැහැ.බලවත් පුරුෂයෙක් තියුණු ආයුධයකින් හිස් මුදුනට තදින් පහර දෙනවා වගේ හිසට දැනෙනවා. කඹයක් අරගෙන හිස වෙලා තදින් ගැට ගසනවා වගේ හිස කකියනවා. හරක් මරණ කෙනෙක් ගවයාගේ කුස, පෙති ගසමින් කැත්තකින් කපනවා වගේ වාත වේදනාව කුසට ඇවිත් මගේ බඩ කපනවා වගේ දැනෙනවා. හොඳට හයිය හත්තිය තියෙන පුරුෂයෝ දෙන්නෙක් ඇවිත් දුර්වල පුරුෂයකු අතින් ඇදගෙන ගිහින් ගිනි අඟුරු වලක දමන කොට වගේ මගේ ඇඟ පුරාම ලොකු දැවිල්ලක් තියෙනවා. මට ඉවසන්න අමාරුයි, මේ දුක් වේදනාව අඩු වෙන්නේම නැහැ.

සැරියුත් හාමුදුරුවෝ දැනගත්තා මේ බමුණාට කම්ම නිමිති, ගති නිමිති පහල වෙලා තියෙනවා කියලා. මරණින් පසු ඔහු නිරයේ උපදින ලකුණු තමයි පෙන්නුම් කළේ. බමුණාගේ සිත නරකාදියේ උපදින මට්ටමින් ඉහලට ගෙන අයුතු බව සැරියුත් හාමුදුරුවෝ තේරුම් ගෙන ඔහු සමග මේ විදියට සාකච්ඡා කළා.

"ධනඤ්ජානි, ඔබට මොකද හිතන්නේ? නරකාදියට වඩා තිරිසන් අපාය හොඳයිද?" එහෙමයි ශාරිපුත්‍රයන් වහන්ස' 'බමුණා තිරිසන් ලෝකෙ උපදිනවට වඩා ප්‍රේතයකු වීම උසස් ද? 'එහෙමයි ශාරිපුත්‍රයෙනි' ප්‍රේත ලෝකෙ උපදිනවට වඩා මනුෂ්‍ය ලෝකෙ උපදින එක හොඳයිද?' "එහෙමයි, මිනිසකු වී ඉපදීම ශ්‍රේෂ්ඨයි" මිනිස් ලොව උපන් අයට වඩා චාතුර්මහාරාජික දිව්‍ය ලෝකෙ අය සැප විඳිනවා නේද? එහෙ උපන්නොත් හොඳයිද?" එහෙමයි එහෙ සැප වැඩියි.

මේ විදියට සැරියුත් හාමුදුරුවෝ මරණාසන්න වූ ධනඤ්ජානිගේ සිත ක්‍රමයෙන් ඉහළ ඉහළ ලෝකවල ඉපදීමට යොමු කරවාගෙන ගිහින් අන්තිමට බ්‍රහ්ම ලෝකයේ ඉපදීමට ධනඤ්ජානි තුළ කැමැත්ත ඇති කළා.

"ධනඤ්ජානි, ඔබ බඹලොව උපදින්න කැමතිද? 'එහෙමයි, 'එසේනම් මං ඒ සඳහා පාර කියා දෙනවා. හොඳින් අහන්න, නුවණින් මෙනෙහි කරන්න. බමුණා මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන මේ හතර හොඳට පුරුදු කිරීමෙන් බඹලොව උපදින්න පුළුවන්. මේ විදියට දස දිසාවෙහිම වෙසෙන සියලු සත්වයන්ට මෙත් වඩන්න ඒ වගේම කරුණාවෙන් ඒ අය ගැන සිතන්න. ඔවුන්ගේ සපයා ගැන සතුටු වෙන්න. සතුරු මිතුරු සියලු දෙනා කෙරෙහි මැදහත් සිතින් වාසය කරන්න. නොනවත්වා ඔබ මේ විදියට සියලු සතුන් කෙරෙහි සිව් බඹ විහරණය පවත්වන්න. බඹ ලොව උපදින්ට තියෙන මාර්ගය තමයි මේක.

හොඳමයි ශාරිපුත්‍රයෙනි, එහෙම පන්සලට වැඩියාට පසු මා වඳිනවා කියල බුදුහාමුදුරුවන්ට වඳින්න." සැරියුත් හිමි වැඩි නොබෝ වෙලාවකින් ධනඤ්ජානි කළුරිය කොට බඹ ලොව ඉපදුණා. මරණාසන්නව සිටින කෙනෙකු සුගතිය කරා යොමු කරන්න. මේ විදියට අපටත් පුළුවන්. ඔබටත් ඒ සඳහා හැකියාව ලැබේවා!

තෙරුවන් සරණයි. !